සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# කතෝලික ධර්මය

08 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- අංක 01 - 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. ලූක් සුබාරංචියේ සමාරම්භක සිද්ධිය ලෙස දක්වන්නේ,

(1) ස්නාවක ජොහාන්තුමාගේ දේශනයයි. (2) ලෝකය මැවීමේ කතාවයි.

(3) ජේසුතුමාගේ වංශාවලියයි. (4) සෙකරියස්තුමාගේ යාගයයි.

02. යහපත් සමරිතානුවරයාගේ උපමාවේ දී ඇගයීමට ලක් කෙරෙනුයේ,

(1) අන්‍ය ජාතික සමරිතානුවරයා ය. (2) ලෙවීවරයා ය.

(3) ජුදා ජාතික පූජකයා ය. (4) යහපත් පර්සියානු ජාතිකයා ය.

03. ඉශ්‍රායෙල්වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දිවැසිවරයා වන්නේ,

(1) ආමොස් දිවැසිවරයා ය. (2) ජෝවෙල් දිවැසිවරයා ය.

(3) සිමියොන් දිවැසිවරයා ය. (4) යොසායා දිවැසිවරයා ය.

04. ධනයට ලොල් වීමට එරෙහිව ජේසුස් වහන්සේ දේශනා කළ උපමාව වන්නේ,

(1) කිරිඳි පිළිබඳ උපමාව ය. (2) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව ය.

(3) රන්කාසි පිළිබඳ උපමාව ය. (4) නැති වූ බැටළුවන් පිළිබඳ උපමාව ය.

05. ජේසුස් වහන්සේ කොටළුවෙකු පිට නැග ජෙරුසලමට පිවිසීම සිහිපත් කරනුයේ,

(1) ගොබ් ඉරුදින ය. (2) උත්ථාන ඉරුදින ය.

(3) මහ සිකුරාදා දින ය. (4) ආලේලූයියා සෙනසුරාදා ය.

06. ෂෙකෙම් නගරයේ ශුද්ධ භූමිය ලෙස හඳුන්වන්නේ,

(1) හාරාන් දේශය ය. (2) ඌර් දේශය ය.

(3) මොරේහි ආලෝන අරඹ ය. (4) කානාන් දේශය ය.

07. ගාබ්‍රියල් දේවදූතයාගේ ප්‍රකාශයට අනුව ජේසුස් වහන්සේ සදහටම රජකම් කරන්නේ කාගේ වංශයට ද?

(1) දාවිත්ගේ වංශයට ය. (2) ජාකොබ්ගේ වංශයට ය.

(3) ජුදා වංශයට ය. (4) බෙන්ජමින්ගේ වංශයට ය.

08. ස්නාවක ජුවාම් තුමා ජුදා නායකයින්ව දුටුවේ කවුරුන් ලෙසද?

(1) සර්පයින් ලෙස ය. (2) කැනහිලුන් ලෙස ය.

(3) වන මෘගයින් ලෙස ය. (4) පොළඟුන් ලෙස ය.

09. "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ පරීක්‍ෂා නොකරන්න." ජේසුස් වහන්සේ මෙසේ පිළිතුරු දුන්නේ කීවෙනි පරීක්‍ෂාවේ දී ද?

(1) 3 වන පරීක්‍ෂාවේ දී ය. (2) 2 වන පරීක්‍ෂාවේ දී ය.

(3) 1 වන පරීක්‍ෂාවේ දී ය. (4) 4 වන පරීක්‍ෂාවේ දී ය.

10. මුතු ඇටය පිළිබඳ උපමාවෙන් පෙන්වා දෙන්නේ,

(1) දේව වචනයේ වැදගත්කම පිළිබඳවයි. (2) දේව රාජ්‍යයේ වර්ධනය පිළිබඳවයි.

(3) දේව වචනයේ ආකල්ප පිළිබඳවයි. (4) ස්වර්ග රාජ්‍යයේ වටිනාකම පිළිබඳවයි.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

11. ජේසුස් වහන්සේ විසින් සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග ............................................................ තිබේ.

12. පාස්කු භෝජනය පැවැත්වීමේ දී ඉශ්‍රායෙල් ජනතාව ............................................................ අනුභව කළහ.

13. ප්‍රථමවරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ ............................................................ පූජක රජතුමා ය.

14. ආත්මීක සූදානමේ අවශ්‍යතාව ............................................................ විසින් පෙන්වා දෙයි.

15. "ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්න." මෙය ............................................................ ප්‍රසාද නිධානයේ දී උච්චාරණය කරයි.

( නුමුහුන් පූප, පහක්, මිදිරස, හතරක්, දිව්‍ය සත්ප්‍රසාදය, මෙල්කිසදෙක්, අභිවෘද්ධි ආලේපය, ශු. පාවුළු තුමා )

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. වෙරළක ඇවිදිමින් ශු. ත්‍රිත්වය පිළබඳව අභිරහස වටහා ගැනීමට උත්සහ කළේ ශු. අම්බ්‍රෝස් තුමා ය. (   )

17. මරණාසන්න පුද්ගලයෙකුට ඕනෑම පියතුමෙකු විසින් අභිවෘද්ධි ආලේපය දානය කළ හැකිය. (   )

18. දේව රාජ්‍යය යනු පාපය ඉවතලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීමයි. (   )

19. කතෝලික ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය හිමි වන්නේ දිව්‍ය සත්ප්‍රසාදයට ය. (   )

20. පෙන්තකොස්ත දිනයේ දී ශු. ත්‍රිත්වය ලොවට වැඩම කළ සේක. (   )

(ල. 2x20 = 40)

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01. (i) ලූක් සුබාරංචිය කාන්තාවන්ගේ සුබාරංචිය ලෙස හැඳින්වීමට හේතු වූ කාන්තා චරිත දෙකක් නම් කරන්න.

(ii) ලූක් සුබාරංචියේ සඳහන්වන ප්‍රශංසා ගීත දෙකක් නම් කරන්න.

(iii) ප්‍රසාද ස්නාපන පොරොන්දු දෙක මොනවාද?

(iv) මාරුත දමනයේ ප්‍රාතිහාර්යයෙන් ලැබෙන පණිවිඩ දෙකක් ලියන්න.

(v) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීමට අප සූදානම් විය යුතු ආකාර දෙක මොනවාද?

(vi) ශුද්ධාත්ම ඵල දෙකක් ලියන්න.

(vii) දේව වාක්‍ය පිළිවෙතෙහි දක්නට ලැබෙන කොටස් දෙකක් ලියන්න.

(viii) අභිවෘද්ධි ආලේපය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් දෙකක් ලියන්න.

(ix) අපගේ ජීවිතයේ ප්‍රාතිහාර්ය අත්දැකීමට නම් සිදු කළ යුතු දේවල් දෙකක් ලියන්න.

(x) ශු. පවුලෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න. (ල. 2x10=20)

02. (i) ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න. (ල. 02)

(ii) අභිවෘද්ධි ආලේපයේ දේව ප්‍රසාද නිධානය ලබන්නන්ට ලැබෙන දීමනා තුනක් ලියන්න. (ල. 03)

(iii) අභිවෘද්ධි ආලේපය ලැබූවන්ගේ යුතුකම් 5 ක් ලියා දක්වන්න. (ල. 05)

03. (i) ශුද්ධාත්මයාණන් වහන්සේට ගැයෙන ගීතිකා දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පුරාණ ගිවිසුමේ "ශුද්ධාත්මයාණන් වහන්සේ" යන යෙදුමට භාවිත කර ඇති යෙදුම් තුන ලියන්න. (ල. 03)

(iii) ශුද්ධාත්ම වරම් පතා පේළි 6 ක පමණ යාච්ඤාවක් ලියන්න. (ල. 05)

04. (i) දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(ii) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ජීවමාන ජේසුස් වහන්සේව ලබාගත් ඔබ කළයුතු යහපත් ක්‍රියා 5 ක් ලියන්න. (ල. 05)

05. (i) දේව රාජ්‍ය පිළිබඳ සංකල්ප දෙකක් ලියා දක්වන්න. (ල. 02)

(ii) ශු. ලූක්තුමා පමණක් සඳහන් කරන උපමා තුනක් ලියා දක්වන්න. (ල. 03)

(iii) දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ දැක්වෙන උපමාවක් ලියා විස්තර කරන්න. (ල. 05)

06. (i) ප්‍රාතිහාර්ය යනු කුමක්දැ'යි අර්ථකථනය කරන්න. (ල. 02)

(ii) ජේසුස් වහන්සේ විසින් සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග තුනක් ලියන්න. (ල. 03)

(iii) මාරුත දමනය ප්‍රාතිහාර්ය කෙටියෙන් ලියා දක්වන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 4 ) 02. ( 1 ) 03. ( 3 ) 04. ( 2 ) 05. ( 1 ) 06. ( 3 ) 07. ( 2 ) 08. ( 4 ) 09. ( 1 ) 10. ( 4 )

11. හතරක් 12. නුමුහුන් පූප 13. මෙල්කිසදෙක් 14. ශු. පාවුළු තුමාය. 15. අභිවෘද්ධි ආලේපය

16. (X) 17. (✓) 18. (✓) 19. (✓) 10. (X)

## II කොටස

01. (i) මරියතුමිය, එළිසබෙත් තුමිය, අන්නා දිවැසිවරිය (පිටු අංක 09)

(ii) මරියාවන්ගේ උදාන ගීය, සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීය, දේවදූතයන්ගේ පැසසුම් ගීය, සිමියොන්ගේ ගීය.

(iii) ♦ නපුර ප්‍රතික්ෂේප කිරීම. ♦ දෙවියන් වහන්සේ විශ්වාස කිරීම.

(iv) ♦ ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බවත් ♦ ස්වභාව ධර්මය පවා උන්වහන්සේට කීකරු වන බවත් ය.

(v) ♦ ආත්මික සූදානම ♦ ශාරීරික සූදානම

(vi) ♦ ස්නේහය ♦ ප්‍රීතිය ♦ සමාදානය ♦ ඉවසීම ♦ කරුණාව ♦ යහපත්කම ♦ නොබිදෙන දිරිය ♦ සාන්තදාන්තකම ♦ විශ්වාසවන්තකම ♦ මර්යාදයාව ♦ ව්‍රතභාවය ♦ පිරිසිදුකම මේවායින් 02 ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(vii) ♦ පළමුවන දේව ප්‍රකාශනය ♦ පිළිතුරු ගීය ♦ දෙවන දේව ප්‍රකාශනය ♦ සුපුවත් ජයනද (සාදුකාරය) ♦ සුවිශේෂ ප්‍රකාශ කිරීම මේවායින් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(viii) ♦ ප්‍රසාද් ස්නාපනය ලබා තිබීම. ♦ වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම. ♦ ඉෂ්ඨ වරප්‍රසාද ඇතිව සිටීම. ♦ නිසි ධර්මෝපදේශයක් ලබා සූදානම් වීම. ♦ මෙම ප්‍රසාද නිධානය ලබා ගැනීමට ඇති ආශාව හා උනන්දුව මේවායින් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ix) ♦ සියල්ල දෙවියන් වහන්සේට කළ හැකි බව විශ්වාස කළ යුතුය. ♦ විශ්වාසයෙන් යාච්ඤා කළ යුතුය. යනාදි පිළිතුරු සලකා බලන්න.

(x) ♦ එකිනෙකාට ගරු කිරීම. ♦ පවුලක් ලෙස එක්ව දෙවිඳුන් යැදීම. ♦ එකිනෙකාට ආදරය දැක්වීම. ♦ සහයෝගයෙන් කටයුතු කිරීම. ♦ ආගමික චාරිත්‍රවලට ගරු කිරීම යනාදි පිළිතුරු සලකා බලන්න.

(ල. 2x10=20)

02. (i) ප්‍රඥාව, තේරුම් ගැනීම, දැනුමැතිකම, ධෛර්ය, දැනගැන්ම, දේව භක්තිය, දේව භය (ල. 02)

(ii) ♦ දෙවියන් වහන්සේට 'අබ්බා පියාණෙනි' යනුවෙන් ඇමතීමට හැකි වීම. ♦ ක්‍රිස්තුස් වහන්සේට වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට හැකි වීම. ♦ ශුද්ධාත්ම දීමනා වර්ධනය වීම. ♦ ශුද්ධ වූ සභාවේ පූර්ණ සහභාගීත්වය වීම. ♦ පරිණත කිතුනුවෙකු හා ක්‍රිස්තුස් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවෙකු ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් විශ්වාසය ප්‍රචලිත කිරීමට හා ආරක්ෂා කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශක්තිය ලැබීම. ♦ ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කිරීම (ල. 03)

(iii) ♦ තමාගේ විශ්වාසය ගැඹුරු කර ගැනීම සඳහා උන්වහන්සේ පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීම. ♦ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ස්ථිර ප්‍රේමයක් ඇති කරගෙන එලෙස ජීවත් වීම. ♦ අවශ්‍ය අවස්ථාවලදී ක්‍රිස්තු ප්‍රේමය සඳහා නැගී සිට එයට සාක්ෂි දැරීම. ♦ ක්‍රිස්තුස් වහන්සේ හා එක්වී ලෝකය ශුද්ධවන්තභාවයට පත් කිරීම සඳහා සෑම උත්සාහයක්ම දැරීම. ♦ පරිණත කිතුනුවන් ලෙස වචනයෙන් සාක්ෂි දැරීම. ♦ පරිණත කිතුනුවන් ලෙස ක්‍රියාවෙන් සාක්ෂි දැරීම. (ල. 05)

03. (i) ♦ ශුද්ධාත්මෙනි ශුද්ධාත්මෙනි .... ♦ ජීවනයේ සමිඳා.... ♦ ස්ප්‍රීන්තු සාන්තු දෙවියනි.... ♦ දෙවන් පහන් මිණි........... යනාදි ගීතිකා (ල. 02)

(ii) ආත්මානුභාවය, දේවාත්මානුභාවය, ශුද්ධාත්මය. (ල. 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

04. (i) ♦ දේව ප්‍රසාද නිධානයකි. ♦ භෝජනයකි. ♦ යාගයකි. ♦ ගිවිසුමකි. ♦ ස්තුති කිරීමකි. ♦ සිහි කිරීමකි. (ල. 02)

(ii) ♦ මෙල්කිසදෙක්ගේ යාගය ♦ මන්නා භෝජනය ♦ ඉශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය ♦ පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය (ල. 03)

(iii) ♦ යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම. ♦ දිනපතා දිව්‍ය පූජාවට සහභාගී වීම. ♦ අසරණයන්ට උදව් කිරීම. ♦ කළ පව්වලට මනස්ථාපනය වීම. ♦ දිනපතා දහම් පාසලට සහභාගී වීම. යනාදිය. (ල. 05)

05. (i) ♦ දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීමයි. ♦ පාපය ඉවත ලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීමයි. ♦ දේව අභිමතයට මිනිස් සමාජය නතුවීමයි. ♦ ප්‍රේමය, සත්‍යය, යුක්තිය, සාධාරණත්වය හා ගුණධර්ම අනුව ජීවත් වීම. (ල. 02)

(ii) ♦ යහපත් සමාරියා පිළිබඳව උපමාව. ♦ නැතිවුණු පුත්‍රයා පිළිබඳව උපමාව ♦ ධනපතියා සහ ලාසරස් පිළිබඳව උපමාව. (ල. 03)

(iii) වපුරන්නා පිළිබඳව උපමාව ♦ නිධානය, මුතු ඇටය සහ දැල පිළිබඳ උපමාව - මේවායින් එකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

06. (i) ස්වභාව ධර්මය තුළ සාමාන්‍යයෙන් සිදු නොවන පුදුම ක්‍රියා. (ල. 02)

(ii) ♦ ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය. ♦ රෝගීන් සුව කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය ♦ දුෂ්ඨාත්මයන් දුරු කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය ♦ මළවුන් උත්ථානය කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය. (ල. 03)

(iii) සිසුවා ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ල. 05)